# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2014 අංක 36 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 ඔක්තෝබර් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 ඔක්තෝබර් මස 24 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 3.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

# 2014 අංක 36 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2014 ඔක්තෝබර් මස 23 වැනි දින]

එල්.ඩී.—ඕ. 3/2014.

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2014 අංක 36 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට 169අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එකී පනතේ 169අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

“අන්තර්කාලීන විධිවිධාන.

169අ. 2012 අංක 21 දරන පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන, පිළිවෙලින් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුව පැවැත් වූ ඡන්ද විමසීම්වල ප්‍රතිඵල ප්‍රකාර ස්ථාපිත කරනු ලැබූ ප්‍රාදේශීය සභාවකට ඉදිරිපත් කරනු ලබන අයවැයකට හෝ පරිපූරක අයවැයකට අදාළ නොවිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.